# රාජ්‍ය වැවිලි ව්‍යවසාය ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

# ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

# ඇබෑර්තු

**ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ පහත සඳහන් පුරප්පාඩුව පිරවීම සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.**

**තනතුර** : **කළමනාකරු - නීති**

**සුදුසුකම්** : **බාහිර අපේක්ෂකයින්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන නීතිය පිළිබඳ ප්‍රථම උපාධිය සමග නීතිඥයෙකු වීම.

සහ

කම්කරු නීතිය පිළිබඳ මනා දැනුමක් හා කම්කරු ගැටළු සම්බන්ධ නෛතික කටයුතු හොඳින් හැසිරවිය හැකි නීති කටයුතු පිළිබඳව හොඳින් කටයුතු කළ හැකි නීතිඥයෙකු ලෙස දිවුරුම් දීමෙන් පසුව නීති ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක පශ්චාත් සුදුසුකම් පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අපේක්ෂකයින්**

ඉහත බාහිර අපේක්ෂකයින්ට අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම.

**වැටුප් පරිමාණය** : කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/216 පරිදි MM 1-1-2016 රු. (53,175-10X1,375-15X1,910-95,575) ක වැටුප් පරිමාණයක් සමග ඉහත තනතුර සඳහා අනුමත අනෙකුත් සියලු දීමනා හිමිවේ.

**බඳවා ගැනීමේ පරිපාටිය** : පත්වීම් බලධාරියා විසින් පත්කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත අයදුම්කරුවන් තෝරා ගනු ලැබේ.

**ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය**

- අදාළ අතිරේක පළපුරුද්ද - ලකුණු 30
- අදාළ අතිරේක සුදුසුකම් - ලකුණු 30
- සාධන (ජයග්‍රහණ) - ලකුණු 15
- සම්මුඛ පරීක්ෂණයේදී ලබාගත් කාර්ය සාධනය - ලකුණු 25

ලකුණු 100

**වයස** : අවුරුදු 22 ට අඩු නොවිය යුතු අතර අවුරුදු 45 ට වැඩි නොවිය යුතුය. උපරිම වයස් සීමාව අභ්‍යන්තර අපේක්ෂකයන්ට අදාළ නොවේ.

**අනෙකුත්** : මෙම කාණ්ඩය සඳහා වන සියලුම බඳවා ගැනීම් බඳවාගැනීමේ පටිපාටියේ විධිවිධානවලට අනුකූලව පමණක් සිදුකෙරේ.

සියලුම අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.

තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

**අතිරේක ප්‍රතිලාභ** : අභ්‍යන්තර හා බාහිර වෛද්‍ය රක්ෂණාවරණ හිමිකම.

සේවක අර්ථසාධක අරමුදලට හෝ ලංකා වැවිලිකරුවන්ගේ අර්ථසාධක සමිතියට සේවක වැටුපෙන් 10% ක අවම දායකත්වයක් හා ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව වෙතින් අර්ථ සාධක අරමුදලට 12% ක හා සේවක භාරකාර අරමුදලට 3% ක දායකත්වය

**අයදුම්පත්** : අයදුම්කරුවන් ස්වකීය අයදුම්පත් සියලු විස්තර සහිතව උප්පැන්න සහතිකය, අධ්‍යාපන සහතික හා පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් සමග අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුරු නාමය සඳහන් කර පහත සඳහන් ලිපිනයට ලැබෙන පරිදි ලියාපදිංචි තැපැල මගින් ඉදිරිපත් කළ යුතුය. අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනෙන් පසුවට ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

රාජ්‍ය / සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන් දෙපාර්තමේන්තු ප්‍රධානීගේ නිර්දේශය සහිතව දෙපාර්තමේන්තු ප්‍රධානී මගින් ස්වකීය අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

**අයදුම්පත් භාරගන්නා අවසාන දිනය** : අයදුම්පත් 2024 මාර්තු 16 වෙනි දින හෝ ඊට පෙර ලැබෙන පරිදි පහත සඳහන් ලිපිනයට යොමු කළ යුතුය.

**සභාපති,**
**ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව,**
**අංක 257, සිරිධම්ම මාවත, කොළඹ 10.**

**2024-02-27**